


ජේසු සමිඳුණෙනි. ඔබවහන්සේ උකුත් වූ සේක එනමුදු ජීවනයේ උල්පත ආත්මයන් වෙත ගලායමින් ඔබවහන්සේගේ කරුණා සාගරය මුළු ලෝකයටම විවෘත කළ සේක. ජීවනයේ උල්පතෙනි, ඔබවහන්සේගේ අපිරිමිත කරුණාවෙන් මුළු ලෝකය වැළඳගෙන ඔබව අප වෙත හිස් කළ මැනව

කරුණාවේ උල්පත වන ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍ය හෘදය තුළින් අප උදෙසා වෑහුණු රුධිරය සහ ජලයෙනි.මම ඔබවහන්සේ කෙරෙහි විශ්වාසය තබමි

## දේව දයාවේ මල්දම.....

**කුරුසියට**

ස්වර්ගයේ වැඩ සිටින

**කුඩා ඇට තුනට**

නමෝ මරිය
විශ්වාස ලක්ෂණය

**සෑම පන්තියකට පෙර ලොකු ඇටවල**

සදාකාලික පියාණෙනි, ඔබවහන්සේ අති ප්‍රේමණීය පුත්‍රයාණන් අපගේ ස්වාමින් ද ගැලවුම්කාරයාණන් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය ද ආත්මය හා දෙවීකය ද

**පිළිතුර** ඃ  අපගේ හා මුළු ලෝකයාගේ පාපවලට වන්දි වශයෙන් ඔබවහන්සේට මම ඔප්පු කරමි.

**සෑම පන්තියකම කුඩා ඇටවලට**

ජේසු තුමන්ගේ අතිකඨුර වූ දුක්ප්‍රාප්තිය මගින්
**පිළිතුර** ඃ අපටත් මුළු ලෝකයාටත් දයාවූව මැනව.

**මල්දම අවසානයේදී**

ශුද්ධවූ දෙවියන්වහන්ස,
ශුද්ධවූ සර්වබලධාරීන් වහන්ස,
ශුද්ධවූ අමරණීයන්  වහන්ස,

**පිළිතුර** ඃ අපටත් මුළු ලෝකයාටත් දයාවූව මැනව

**<u>අවසන් යැදුම</u>**

සදාතන දෙවිඳුනි,
කිසිදින නොසිඳෙන දයානුකම්පාවේ නිධානය වන අනන්ත කරුණාබර ස්වාමිනී, අප දෙස දයාවෙන් බලා, ඔබවහන්සේගේ කරුණාව අප තුළ වැඩි වර්ධනය කල මැනව. අපගේ කරදර හා කම්කටොළු වලදී කල කිරීමට සහ අධෛර්යය වීමට ඉඩ නොදුන මැනව. මහත් බලාපොරොත්තුවකින් යුතුව ආදරය හා කරුණාව වන ඔබවහන්සේගේ ශුද්ධවූ කැමැත්තට අපි භාර වෙමු. ආමෙන්.